සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

# Primary Piriven Year End Term Test - 2016

5 වසර / Grade 5

**සාමාන්‍ය විද්‍යාව**
**General Science**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ I වන කොටසේ ප්‍රශ්න සියල්ලටත් , II වන කොටසින් ප්‍රශ්න <u>**හතරකට**</u> ද පිළිතුරු ලියන්න.

## I කොටස

01) සුදුසු වචනය / වචන යොදා පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පුරවන්න.

1. සාමාන්‍ය වියලි කෝෂයක වෝල්ටීයතාවය (විද්‍යුත්ගාමක බලය) වොල්ට් .................................. පමණ වේ. ගෘහ විද්‍යුත් පරිපථයට සපයන විදුලියේ විභව අන්තරය වෝල්ට් ................................ කි. වියලි කෝෂයකින් ලබාගන්නා විද්‍යුත් ධාරාව පරිපථයේ එක් දිශාවකට පමණක් ගලන ................................. ධාරාවක් වන අතර ගෘහ විද්‍යුත් පරිපථයක ධාරාව දෙපසටම ගලන හෙයින් එය ................................. ධාරාවක් ලෙස හඳුන්වයි.

2. ධ්වනිය ගමන් කිරීමට ................................. අවශ්‍යවේ. වාතය තුළින් ධ්වනිය ගමන් කරන්නේ ................................. තරංග ආකාරයට වන අතර ජලපෘෂ්ඨයක් ඔස්සේ ජල තරංගයක් ගමන් කරන්නේ ................................. තරංග ආකාරයටයි.
ගුවන් විදුලි තරංග, අධෝරක්ත කිරණ, දෘෂ්‍ය ආලෝකය වැනි තරංග ................................. තරංග ගණයට අයත්වේ.

3. තල දර්පණයකට වදින ආලෝක කිරණයකට සිදුවන දේ මින් නිරූපණය වේ. මෙහි A මගින් .................................................. කිරණයත් B මගින් ................................. කිරණයත් නිරූපණය වේ. $x^0$ වලින් දක්වන්නේ ................................. කෝණයයි. P මගින් දක්වෙන ලක්ෂය හඳුන්වන්නේ ................................. ලක්ෂය ලෙසයි.




4. මිනිස් සිරුරේ ස්නායු පද්ධතිය ප්‍රධාන කොටස් දෙකකි. එනම් මධ්‍ය ස්නායු පද්ධතිය හා ................................. ස්නායු පද්ධතිය යනුවෙනි. මධ්‍ය ස්නායු පද්ධතිය නැවත කොටස් දෙකකට බෙදේ ඒ ................................. සහ ................................. වශයෙනි. ස්නායු පද්ධතියේ තැනුම් ඒකකය ලෙස සලකන්නේ ................................. නැමති සෛලයයි.

5. පරමාණුවක න්‍යෂ්ටියේ ධන ආරෝපණයක් සහිත අංශුව ................................. සහ

ආරෝපණයක් නොමැති අංශුව ................................ පිහිටයි. න්‍යෂ්ටිය වටා ඇති ශක්ති මට්ටම්වල සෘණ ආරෝපණයක් සහිත අංශුව ................................ පිහිටයි.
යම් මූල ද්‍රව්‍යක පරමාණුක ක්‍රමාංකය ලෙස හඳුන්වන්නේ පරමාණුවේ න්‍යෂ්ටියේ පිහිටන ................................ සංඛ්‍යාවයි.

6. ශ්‍රී ලංකාවේ හුණු නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යක් ලෙස ................................ යොදාගනී. සිමෙන්ති නිෂ්පාදනයේදී ඉහත හුණු නිෂ්පාදනයට යොදාගත් අමුද්‍රව්‍ය සහ ...................... ...................... භාවිතයට ගන්නා අතර අවසානයේදී ජිප්සම්ද එකතු කරයි. සමුද්‍රය විශාල සම්පතක් ලෙස භාවිතා කර ඉන් ආහාර රසවත් කිරීමට අවශ්‍ය ලුණු නිපදවා ගන්නා අතර එහි විද්‍යාත්මක නම පැස්සුම් කටයුතුවලට යොදාගන්නා දැල්ල ලබාගැනීමට ඇසිටලීන් වායුව සමග ........................................ වායුව භාවිත කරයි.

7. පරම්පරාවෙන් පරම්පරාවට ගමන්කරන ලක්ෂණ ................................ ලක්ෂණ ලෙස හඳුන්වයි. මානව දේහ සෛලයක න්‍යෂ්ටියේ යුගල් 23 ක් ලෙස පවතින ........................ ........................................ තුල ................................ නැමති සාධක ඇත. එමගින් දෙමව්පිය ලක්ෂණ දරුවන්ට උරුම වේ. මේ පිළිබඳව මුල්ම පර්යේෂණ කළ විද්‍යාඥයා වන්නේ ඔස්ට්‍රියානු ජාතික ................................ නැමති පූජක වරයා ය.

8. මහ පොළොවට ශක්තිය ලබාදෙන මූලික ප්‍රභවය වන්නේ ................................ ය. එම ශක්තිය පොළොව තුල ගබඩා කර තබාගන්නා ජීවියා වන්නේ ................................ යි. එම ජීවියා විසින් සිදුකරනු ලබන ක්‍රියාවලිය ................................ ලෙස හඳුන්වයි. මෙම ක්‍රියාවලිය සඳහා වායුගෝලයෙන් ලබාගන්නා වායුව ................................ ය.

9. මිනිස් සිරුර තුල ඇති සෛලවල ශක්තිය නිපදවීමේ ක්‍රියාවලියට අවශ්‍ය ........................... වායුව සිරුරට ඇතුලු කර ගන්නා ඉන්ද්‍රිය ............................ යි. වායු හුවමාරුව සිදුකරගන්නේ පෙණහැලි තුල ඇති කුඩා වායු කුහර වන ................................ තුළදීය. මෙම පද්ධතියට වැළඳෙන රෝගයක් ලෙස ............................ දැක්විය හැකියි.

10. අප රටේ කසල ප්‍රශ්නය මේ වන විට උග්‍ර තත්ත්වයකට පත්ව ඇත. පසුගිය දිනක .................................... ප්‍රදේශයේ කුණු කන්දකට ගිනි තැබීම නිසා බොහෝ පිරිසකට ශ්වසන ආබාධ ඇතුළු ගැටලු සමූහයකට මුහුණ දීමට සිදුවිය. කසල කුණුවීමේදී ............... .................. නැමති වායුව පිටවේ. අප රටේ මෙලෙස අක්‍රමවත් ව කසල බැහැර කිරීම සිදු වුවත් ................................ කිරීම මගින් එහි ඇති බෝහෝ ද නැවත භාවිතයට ගත හැකි තත්ත්වයකට පත් කළ හැක. මෙලෙස නැවත සකස් කළ හැකි ද්‍රව්‍යයක් ලෙස ................. ............... දැක්විය හැකියි. (ල. 4 x 10 = 40)

## II කොටස

02) මෙහි දැක්වෙන් ගෘහ විද්‍යුත් පරිපථයකි.




1. මෙහි අක්ෂර වලින් දැක්වෙන කොටස් නම් කරන්න. (ල. 4)
2. නිවස වෙතට විදුලිය ලබාගන්නා රැහැන රතු සහ කලු රැහැන් දෙකකින් සමන්විතය. එම රැහැන් හඳුන්වන නම් මොනවාද ? (ල. 2)
3. අප පරිභෝජනය කරන විදුලි ප්‍රමාණය මනිනු ලබන උපකරණය කුමක්ද ? (ල. 2)
4. පරිභෝජනය කරන විදුලි ප්‍රමාණය මනිනු ලබන ඒකකය කුමක්ද ? (ල. 2)
5. නිවසක වැඩිම විදුලි ප්‍රමාණයක් පරිභෝජනය කරන උපකරණයක් සඳහන් කරන්න. (ල. 2)
6. විදුලි පරිභෝජනය අර පිරි මැස්මෙන් සිදුකිරිම සඳහා අනුගමනය කළහැකි ක්‍රම 2 ක් සඳහන් කරන්න. (ල. 2)
7. ගෘහ විද්‍යුත් පරිපථයකට භූගත රැහැනක් අවශ්‍ය වන්නේ ඇයි ? (ල. 1) (ල. 15)

03) මිනිස් සිරුරේ අන්නායුක සමායෝජනය හෙවත් හෝමෝන මගින් සිදුකරන සමායෝජනය මෙහි දැක්වෙන අන්තරාසර්ග ග්‍රන්ථි මගින් නිකුත්කරන හෝමෝන නැමති කාබනික රසායනික සංයෝග මගින් සිදුවේ.




1. හෝමෝන නිපදවන ග්‍රන්ථිවල නිපදවන හෝමෝන අවශ්‍ය ස්ථාන කරා පරිවහනය කෙරෙන්නේ කෙසේද? (ල. 2)
2. අන්තරාසර්ග ග්‍රන්ථි නිර්නාල ග්‍රන්ථි ලෙස හඳුන්වයි. ඒ ඇයි දැයි පහදන්න. (ල. 2)

3. අග්න්‍යාශයේ නිපදවන හෝමෝනය සිරුරේ ග්ලූකෝස් මට්ටම පාලනය කිරීමට දායකවේ. එම හෝමෝනය කුමක්ද ? (ල. 2)

4. ඉහත දක්වන හෝමෝනය නිපදවීම අඩාල වුවහොත් ඇතිවන රෝගී තත්ත්වය කුමක්ද ? (ල. 2)

5. දරුවෙක් අසාමාන්‍ය ලෙස වර්ධනය වීමට හෝ වර්ධනය අඩාල වීමට හේතුවන හෝමෝනය ශ්‍රාවය කරන්නේ මෙහි දැක්වෙන කවර අන්තරාසර්ග ග්‍රන්ථියෙන්ද ? එම හෝමෝනයේ නමද සඳහන් කරන්න. (ල. 2)

6. මිනිස් සිරුරේ ජල සමතුලිතතාව පවත්වාගැනීම දායකවන අවයවය කුමක්ද ? (ල. 2)

7. වැඩිපුර දහඩිය දමන දිනවල මුත්‍ර පිටවීම අඩුවේ. ඒ ඇයි දැයි පහදන්න. (ල. 3)

(ල. 15)

04) අප රටේ ශාක ආශ්‍රිත කර්මාන්ත සමුහයක් ඇත. ඉන් කීපයක් ලෙස විනාකිරි නිපදවීම, තෙල් වර්ග නිපදවීම ආදිය ගත හැකියි.

1. මෙහි දක්වා නැති ශාක ආශ්‍රිත නිෂ්පාදන 3 ක් සඳහන් කරන්න. (ල. 3)
2. එදිනෙදා ඉවත දමන පොල් වතුරෙන් නිපදවාගත හැකි අම්ලය කුමක්ද ? (ල. 2)
3. පැසීමේ ක්‍රියාවලියක් තුලින් මධ්‍යසාර නිපදවන අතර ඒ සඳහා දායකවන ක්ෂුද්‍රජීවියා නම් කරන්න. (ල. 2)
4. ශ්‍රී ලංකාවේ ශාක ඇසුරෙන් නිපදවාගන්නා වාෂ්පශීලි තෙල් සගන්ධතෙල් වන අතර එවැනි තෙල් නිපදවීමට යොදාගන්නා ශාක 2 ක් සඳහන් කරන්න. (ල. 3)
5. ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනය කරන ස්ථාන 2 ක් සඳහන් කරන්න. (ල. 2)
6. ලුණු වෙළඳ පොළට නිකුත් කිරීමට පෙර එක්තරා මුලද්‍රව්‍යයක් එකතු කරයි. ඒ කුමක්ද ? (ල. 2)
7. එම මුලද්‍රව්‍ය එකතු කිරීම මගින් වලක්වාගැනීමට අපේක්ෂා කරන රෝගය නම් කරන්න. (ල. 1) (ල. 15)

05) පහත සඳහන් සිද්ධීන් 3 ක් විද්‍යාත්මකව පහදන්න.

1. විදුලි ස්ත්‍රික්ක වැනි උපකරණ භාවිතා කිරීමේදී රබර් පලසක් මත සිට හෝ රබර් පාවහන් පැළඳ එය සිදුකිරීම යෝග්‍ය වේ.
2. පැහැදිලිව නොපෙනෙන අකුරු හොදින් කියවා ගැනිම සඳහා අත්කාචයක් භාවිතා කරනු ලැබේ.
3. වතුර වීදුරුවකට දැමූ පැන්සලක් කැඩී ඇති ලෙස පෙනේ.
4. චන්ද්‍රයා මත සිටින අභ්‍යවකාශ ගාමීන් දෙදෙනෙක් ඉතා සමීපව සිටියත් අදහස් හුවමාරු කර ගැනිම සඳහා ගුවන්විදුලි තරංග භාවිතා කිරිමට සිදුවේ.
5. සිරුරට ගිනි ඇවිලුනු පුද්ගලයෙක් බේරාගැනිම සඳහා ඔහුගේ සිරුර වටා සනකම් ගෝනියකින් ඔතනු ලැබේ. (ල. 15)

06) පහත සඳහන් කරුණු 3 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1. දුර සහ විස්ථාපනය අතර වෙනස්කම.
2. සංගීත භාණ්ඩ සුසර කිරීම.
3. දේදුන්න ඇති වීම.
4. ප්‍රතීක ක්‍රියා.
5. ඩෙංගු රෝගය. (ල. 15)

07) රූපයේ දක්වෙන පරිදි ඇටවුමක් සකස්කර චුම්භකය දඟරය තුලට හා ඉන් ඉවතට චලනය කරනු ලැබේ.




1. මෙහි X උපකරණය කුමක්ද ? (ල. 2)
2. චුම්භකය චලනය කරන විට ලැබෙන නිරීක්ෂණය කුමක්ද ? (ල. 2)
3. එමගින් ලබාගත හැකි නිගමනය කුමක්ද ? (ල. 2)

මෙහි දක්වෙන්නේ එක්තරා වර්ගයක විදුලි ජනකයකි.




4. මෙම විදුලි ජනකයේ කොටස් නම් කරන්න. (ල. 4)
5. මෙය භාවිතයට ගන්නා අවස්ථාවක් සඳහන් කරන්න. (ල. 2)
6. විදුලි ජනකය සඳහා ජලය සහ ඉන්ධන වලට අමතරව යොදාගැනෙන වෙනත් ශක්ති ප්‍රභව 2 ක් සඳහන් කරන්න. (ල. 2)
7. ඉන්ධනයක් ලෙස ගල් අඟුරු භාවිතා කිරීම නිසා පරිසරයට එකතුවන අහිතකර වායුවක් නම් කරන්න. (ල. 1) (ල. 15)